# නව ව්‍යවස්ථාව සඳහා සිවිල් සමාජ එකමුතුව

**දිනය** - 2015/12/08

**වේලාව** - ප.ව. 3.30 - ප.ව. 5.30

**ස්ථානය** - හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

**සංවිධානය** - විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය



## හැඳින්වීම

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සඳහා සිවිල් සමාජයේ දායකත්වය පිළිබඳ හා සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගෙන් ඉදිරිපත් වූ අදහස් හා යෝජනා පිළිබඳව සාකච්ඡා කිරීමේ රැස්වීමක් 2015/12/08 වන දින ප.ව. 3.30 ට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේදී පැවැත්විණි.

## අරමුණ

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිවිල් ක්‍රියාකාරීන් හා පුරවැසියන් යොමු කර ඇති අදහස් හා යෝජනා පිළිබඳව සාකච්ඡ කිරීම හා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීම පිළිබඳව මහජනතාව දැනුවත් කරනු ලබන අත් පත්‍රිකාවේ අන්තර්ගතය සළකා බැලීම.

පැමිණ සිටි සියලුම සිවිල් ක්‍රියාකාරීන් පිළිගනිමින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂක ලයනල් ගුරුගේ මහතා ප්‍රකාශ කළේ මීට පෙර පැවති රැස්වීම එනම් 2015/12/01 දින රැස්වීමේදී ප්‍රධාන කාරණා දෙකක් පිළිබඳව අවධානය යොමු කළ බවයි. එනම්,

1. **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව අවබෝධය සරල ලෙස මිනිසුන් අතරට ගෙන යාම.**
2. **නව ව්‍යවස්ථාවේ අන්තර්ගත විය යුතු ප්‍රධාන තේමාවන් හතර පිළිබඳව.**

ඒ අනුව මෙම කාර්යයන් සිදු කර ගැනීම පිළිබඳව අවධානය යොමු කළයුතු බවයි. ඒ අනුව කමිටුවේ කටයුතු පිළිබඳව දැන ගැනීමට එස්.ජී. පුංචිහේවා මහතාට අවසථාව ලබා දෙන ලදි.

**එස්.ජී. පුංචිහේවා මහතා** - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව මිනිසුන්ව දනුවත් කිරීමට අත්පත්‍රිකාවක් නිර්මාණය කරන බවත් එමඟින් බොහෝ සරලව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අවශ්‍යතාවය මතු කරන බවයි. එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකින් මිනිසාට ඇති ප්‍රයෝජනය හා ඔහුගේ මූලික අවශ්‍යතාවන් ඒ හරහා ඉටුවන්නේ දැයි ඉතාමත් සරලව එය නිර්මාණය කළයුතු බවයි. එ අනුව එස්.ජී. පුංචිහේවා මහතා කරුණු පහක් යටතේ දීර්ඝ ලෙස තම අදහස් දැක්වීම සිදු කරන ලදි.



එම කරුණු පහ ලෙස,

1. **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අපට අවශ්‍ය ඇයි?**
2. **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනු කුමක්ද?**
3. **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අඩංගුවිය යුතු දේ**
4. **නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගැන මහජනයා අදහස් දැක්විය යුත්තේ කෙසේද?**
5. **ශ්‍රී ලංකාවට අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍ය මක්නිසාද?**

එස්.ජී. පුංචිහේවා මහතාගේ දීර්ඝ අදහස් දැක්වීමෙන් පසු ඒ පිළිබඳව පැමිණ සිටි සිවිල් ක්‍රියාකාරීන් දක්වන ලද්දේ මෙවන් අදහස් කීපයකි.

**නන්දන වීරරත්න මහතා** - වත්මන් ව්‍යවස්ථාවේ පවතින ගැටළුව පැහැදිලිවම ආමන්ත්‍රණය කළයුතු බවත් ව්‍යවස්ථාවේ පැවැති ගැටලු නිසා තිස් වසරක යුද්ධය ඇති වූ බවත් සඳහන් කරමින් මෙම කරුණද ඊට ඇතුළත් කළ යුතු බවයි. එසේම වයස්ගත වැඩිහිටියන් හා ආබාධිත අය රැකබල ගැනීමේදී ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවට යම් ප්‍රතිපාදන ඇතුළත් කළ යුතු බවත් මෙය වත්මන් ශ්‍රී ලංකාවේ දැඩි අර්බුදයක් නිසා අත්‍යාවශ්‍ය කරුණක් බවද සඳහන් කරන ලදි.

**ප්‍රියදර්ශනී ආරියරත්න මහත්මිය** - එස්.ජී. පුංචිහේවා මහතා ඉදිරිපත් කරන ලද කරුණු අතර පුරවැසි සංකල්පය අන්තර්ගත නොවූ බවත්, පුරවැසියාගේ දායකත්වය, සමාන අයිතීන් දිනා ගැනීම හා පුරවැසි සංකල්පය සමාජගත කිරීම පිළිබඳව කරුණුද අන්තර්ගත විය යුතු බවයි.

**කෞශල්‍යා කුමාරසිංහ මහතා** - නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේදී බලය බෙදීම යන කාරණයේදී ජනවාර්ගිකත්වය යන්න ගැටළුවක් විය හැකිද? යන්න මතු කළ අතර ඒ පිළිබඳවද සඳහන් කිරීම යෝග්‍ය වන බවයි.

**රෝහණ හෙට්ටිආරච්චි මහතා** - නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මිනිසුන්ගේ අදහස් ලබා ගැනීමේ සහභාගීත්වය තහවුරු කරන්නා වූ යම් කිසි විධිමත් ක්‍රමවේදයක් පවතීද? යන්න මතු කළ අතර නියමිත, විධිමත් ක්‍රමවේදයකින් තොරව විවෘතව මහජන අදහස් ලබා ගතහොත් යම් අඩුපාඩුවක් ඇතිවිය හැකි බවත් සඳහන් කරන ලදි. එසේම මැතිවරණ සංශෝධනය පිළිබඳව මීට අන්තර්ගත කළ යුතු බවත් මේ වන විටත් පැෆරල් සංවිධානය මැතිවරණ ක්‍රමය පිළිබඳව මහජනතාවගෙන් යම් යම් අදහස් ඒකාර්ශී කරමින් සිටින බවත් එම අදහස් හා යෝජනා මෙම කාර්යයට උපකාරී කරගත හැකි බවද සඳහන් කරන ලදි.

**මහින්ද රත්නායක මහතා** - නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කිරීමේදී ආණ්ඩුව ජනතා කමිටුවක් පත් කිරීමට ක්‍රියා කරන අතර වර්ගීකරණ 10ක් යටතේ කරුණු ඒකරාශී කිරීමට සූදානම් බවයි. එම වැඩපිළිවෙළ ජනවාරි මසයේ ආරම්භ කර මාස 06 ක කාලයක් ඇතුළත අවසන් කිරීමට ක්‍රියා කරන බවයි. මෙහිදී මහජනතාවගේ අදහස් දැක්වීමට ලබා දෙන්නාවූ සති තුනක කාලය ප්‍රමාණවත් නොවන අතර ඊට ප්‍රමාණවත් කාලයක් ලබා ගැනීම සඳහා ක්‍රියා කළ යුතු බවයි. එසේම එම කමිටුවට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු මහතාව යෝජනා කිරීම පිළිබඳවද අදහස් දක්වන ලදි.



**මුදිත කරුණාමුණි මහතා** - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අතිශය සංකීර්ණ වචන වලින් තොරව සරලව මිනිසුන්ට අවබෝධකරගත හැකිවන පරිද්දෙන් නිර්මාණය කළයුතු බවත් එය සරල භාෂාවකින් ලියැවිය යුතු බවත්ය.

ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව ජනතාවට සරල අවබෝධයක් ලබා දීම උදෙසා නිර්මාණය කරන අත්පත්‍රිකාව පිළිබඳ අදහස් දැක්වීම ඉහත පරිදි සිදු වූ අතර සියල්ලන්ම පාහේ අවධාරණය කළේ ව්‍යවස්ථාවේ යම් යම් සාධනීය ප්‍රතිපාදන තිබුණද ඒවා නිසි පරිදි ක්‍රියාත්මක නොවීම බරපතල ගැටලුවක් වන බවයි.

අනතුරුව අද වැඩටහනේ මූලික අරමුණ වන සිවිල් ක්‍රියාකාරීන්ගෙන් හා මහජනයාගෙන් ලැබුණු අදහස් හා යෝජනා පිළිබඳව අවධානය යොමු කිරීම ආර්ම්භ කළ අතර මේ සම්බන්ධව ප්‍රධාන වශයෙන් **ආචාර්ය පාක්‍යසෝතී සරවනමුත්තු මහතා** අදහස් දක්වන ලදි.



මෙම වාර්තාවේ එකිනෙකට පරස්පර විවිධ නොගැලපීම් ඇති අතර එයට හේතුවන්නේ බොහෝ දෙනෙකුගේ විවිධ ආකල්ප හා අදහස් මත මෙම වාර්තාව ගොඩ නැගී ඇති නිසා බවයි. එසේම මිනිසුන් ඉදිරිපත් කරනු ලබන සෑම අදහසක්ම, යෝජනාවක්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අන්තර්ගත කළ නොහැකි බවත් ඒ සඳහා තාර්කික පදනමක් පැවතිය යුතු බවයි. එමෙන්ම ඉදිරිපත් වූ යෝජනා සම්බන්ධව අදහස් දක්වමින් අවධාරණය කර සිටියේ යම් දේශපාලන පක්ෂයක් ජාතීවාදීද? ආගම්වාදීද? යන්න තීරණය කරන්නේ කෙසේද යන්න බවයි. මන්ද දමිළ හා මුස්ලිම් පදනම මත විශාල දේශපාලන පක්ෂ ප්‍රමාණයක් දැනටමත් පවතින නිසාය. මෙවැනි කාරණා රාශියක් ඉදිරිපත් කරමින් සරවනමුත්තු මහතා අවධාරණය කරන ලද්දේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මහජන අදහස් ඉතාමත් තාර්කික හා බුද්ධිමය පදනමක් මත අන්තර්ගත කළ යුතු බවයි.

**එල්මෝ පෙරේරා මහතා** විසින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අන්තර්ගත කළයුතු යැයි සැළකෙන යෝජනා රාශියක් ඉදිරිපත් කළ අතර එම යෝජනා සිංහල භාෂාවට පරිවර්තනය කිරීමට කටයුතු කළයුතු බව ලයනල් ගුරුගේ මහතා ප්‍රකාශ කරන ලදි.



**මහින්ද රත්නායක මහතා** - නීතිපති දෙපාර්තමේන්තුව වත්මන්ව ගැළපෙන පරිදි නිසියාකාරව ක්‍රියාත්මක නොවීම පිළිබඳව සාකච්ඡා කළ අතර එම අඩුපාඩු හා ත්ත්වයන් වළක්වා ගැනීමට කළ හැක්කේ කුමක්ද? යන්න සම්බන්ධව ප්‍රශ්න කරන ලදි. එසේම අලුත් ව්‍යවස්ථාවකින් මෙම ප්‍රශ්න පැහැදිලිවම ආමන්ත්‍රණය කළයුතු බවයි.

**එස්.ජී. පුංචිහේවා මහතා** - මහින්ද රත්නායක මහතා දැක්වූ අදහසට ප්‍රතිචාර වශයෙන් සඳහන් කළේ නීතිපති දෙපාර්තමේන්තුව විසින් අවසාන අවස්ථාවේ නඩුව ඉල්ලා අස්කර ගැනීම් පිළිබඳව බොහෝදෙනා කතා කරන බවයි. නීතිපති දෙපාර්තමේන්තුව බ්‍රිතාන්‍ය සම්ප්‍රදාය මත ගොඩ නැගුණද එම සම්ප්‍රදායට පටහැනි ආකාරයේ මෙවැනි ක්‍රියා සිදු කිරීම අවධානයට යොමුකළ යුතු බවයි.

**ප්‍රියදර්ශනී ආරියරත්න මහත්මිය** - යෝජනා කර ඇති කොමිෂන් සභා පිළිබඳව අවධානය යොමු කිරීමේදී කාන්තාවන්ට හා ළමයින්ට එක් කොමිසමක් නොව ඔවුන්ට වෙන වෙනම කොමිෂන් සභා දෙකක් සෘජුවම පත් කළ යුතු බව සඳහන් කරන ලදි.

**මහින්ද රත්නායක මහතා** - මිනිසුන් විසින් එවන සෑම යෝජනාවක්ම ඒ ආකාරයෙන්ම ඇතුළත් නොකර ඒවා නිසිපරිදි ගළපාගෙන ඉදිරිපත් කිරීම වඩාත් යෝග්‍ය විසඳුම වන බවයි.

ඒ අනුව මෙම අදහස් දැක්වීමෙන් පසුව ලයනල් ගුරුගේ මහතා සඳහන් කරන ලද්දේ අද දින ඉදිරිපත් කරන ලද යෝජනා සම්බන්ධයෙන් තවදුරටත් අදහස් දැක්වීමක් අප වෙත එවන ලෙසයි. එනම් දෙසැම්බර් මස 18 වන දිනට පෙර අදහස් දැක්වීම් හා යෝජනා ඉදිරිපත් කරන ලෙසයි. ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු මහතා ප්‍රකාශ කරන ලද්දේ අප වෙත බොහෝ අදහස් හා පැමිණිලි ලැබුණහොත් ඒ සඳහා කුඩා කණ්ඩායමක් නිර්මාණය කර ගැනීම උපකාරී වන බවයි.

අද දින එල්මෝ පෙරේරා මහතා විසින් ඉදිරිපත් කරන ලද අදහස් සහිත ලිපියේ පරිවර්තනයක් සෑම අයෙකුටම ලැබීමට සළස්වන බව ලයනල් ගුරුගේ මහතා දක්වන ලදි.

අනතුරුව අපවෙත ලැබෙන අදහස් හා යෝජනාවල නෛතික කරුණු හා පසුබිම අධීක්ෂණය හා විමර්ෂණය කිරීම පිණිස පහත දැක්වෙන පුද්ගලයන්ගෙන් සමන්විත කුඩා කණ්ඩායමක් සකස් කර ගන්නා ලදි.

1. එල්මෝ පෙරේරා මහතා
2. එස්.ජී. පුංචිහේවා මහතා
3. ලුවී නෙරන්ජන් මහතා
4. දුමිදු මධුෂාන් මහතා

එසේම දෙසැම්බර් 18 සිට 22 දක්වා මෙම කමිටුව වෙත ඉදිරිපත්වන අදහස් විමසා බලන අතර එම කමිටුවට එක්වීමට අදහස් කරන පුද්ගලයන් සිටී නම් ඊට ඉඩකඩද පවතින බවද සාකච්ඡා විය.

ඒ අනුව මෙම රැස්වීමේ වැඩිදුර කටයුතු දෙසැම්බර් මස 22 වනදා පැවැත්වීමට කතිකා කරගත් අතර එදින නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධව මහජන අදහස් ලබා ගැනීම පිළිබඳව මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වීම හා මේ සම්බන්ධයෙන් රජය දැනුම්වත් කිරීමේ වැඩපිළිවෙළක් නිර්මාණය කිරීමට කටයුතු කරන බවට එකඟ වන ලදි. ඒ අනුව පැය දෙකක් පමණ පුරා සාර්ථකව පැවති රැස්වීම ප.ව. 5.30 ට පමණ අවසාන විය.




මෙම වැඩසටහන සහභාගීවූවන්

1. මහින්ද රත්නායක
2. ක්‍රිස්ටීන් පෙරේරා
3. ප්‍රියදර්ශනී ආරියරත්න
4. නන්දන වීරරත්න
5. එස්.ජී. පුංචිහේවා
6. මුදිත කරුණාමුණි

7. සාෂා ද මෙල්
8. සුරනි සුමනසේකර
9. රෝහණ හෙට්ටිආරච්චි
10. කෞෂල්‍යා කුමාරසිංහ
11. රවී කන්දගේ
12. එල්මෝ පෙරේරා
13. වයි.එම්.ඩබ්. දිසානායක
14. ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු
15. ලයනල් ගුරුගේ
16. රුවෙන්දි වක්වැල්ල
17. දුමිදු මධුෂාන්
18. ඩියෙගො සැම්සන්